# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2253/6 – 2021 නොවැම්බර් මස 08 වැනි සඳුදා – 2021.11.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2021 අංක 214 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/8/2018/PC/418.
ප්‍රා. ලේ. යොමු අංකය:MUL/LND/2/ACQ/97.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තිය (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය,

2021 නොවැම්බර් මස 02 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැඳුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.** – ප්‍රාදේශීය ලේකම්, මුලටියන.

2. **ඉඩමේ විස්තරය.** – දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දබඩපත්තුව සුළු කොට්ඨාසයේ ගල්ඇටුඹ (අ.ග.පි. 89) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක MR/MLT/2019/699 හා 2020.09.15 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – කළුගහහේන – ප්‍රමාණය: හෙක්. 1.6187 ක් පමණ**

උතුරට: අබේසිරිනාරායන වනිගරත්න නන්දසිරි සහ තවත් අය විසින් හිමිකම් කියන කළුගහහේන සහ ටී. ප්‍රැන්සිස් හිමිකම් කියන අඹගහකුට්ටිය පිටකොරටුව; නැගෙනහිරට: චන්දන කරුණාරත්න සහ තවත් අය විසින් හිමිකම් කියන ගමරාලගෙ වත්ත, ප්‍රැන්සිස් සේනානායක සහ විජිත කුමාර යන අය විසින් හවුලේ හිමිකම් කියන ගමරාලගෙ වත්ත සහ මාර්ග (ප්‍රාදේශීය සභා); දකුණට: මාර්ග (ප්‍රාදේශීය සභා); බටහිරට: දෙයියන්දර හඳුගල මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය).

11-513


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2021 අංක 217 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/19/2019/E/184.
ප්‍රා. ලේ. යොමු අංකය:BD/BD/LND/3/5/57.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තිය (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය,

2021 නොවැම්බර් මස 02 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී. –** ප්‍රාදේශීය ලේකම්, බදුල්ල.

2. **ඉඩමේ විස්තරය. –** ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රිල්පොල කෝරළේ සුළු කොට්ඨාසයේ, වේවැස්ස (80J) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, රඹුක්පොත (අ.ග.පි. 37) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක B/BDL/2019/485 හා 2020.04.24 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – වේවැස්සවත්ත හිගුරුගමුව කොටස – ප්‍රමාණය: හෙක්. 2.4281 ක් පමණ**
උතුරට: මාර්ගය, මාර්ගය (ප්‍රාදේශීය සභා), දියකොටුව විතානගේ සරත් අමරසිරිද සිල්වා, කෝනාර මුදියන්සේලාගේ ඩිංගිරිබණ්ඩා, ලියනගේ කුලසේකර, කෝනාර මුදියන්සේලාගේ ධර්මරත්න සහ රත්නායක මුදියන්සේලාගේ චන්ද්‍රිකා දමයන්ති හිමිකම් කියන වේවැස්ස වත්ත; නැගෙනහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා), දියකොටුව විතානගේ සරත් අමරසිරිද සිල්වා, කෝනාර මුදියන්සේලාගේ ඩිංගිරිබණ්ඩා, ලියනගේ කුලසේකර, කෝනාර මුදියන්සේලාගේ ධර්මරත්න, රත්නායක මුදියන්සේලාගේ චන්ද්‍රිකා දමයන්ති හිමිකම් කියන වේවැස්ස වත්ත සහ මාර්ගය; දකුණට: බලංගොඩ වැවිලි සමාගම හිමිකම් කියන වේවැස්ස වත්ත; බටහිරට: බලංගොඩ වැවිලි සමාගම හිමිකම් කියන වේවැස්ස වත්ත සහ මාර්ගය.

02. **කැබලි අක්ෂර 'B' – වේවැස්සවත්ත හිගුරුගමුව කොටස – ප්‍රමාණය: හෙක්. 2.4281 ක් පමණ**
උතුරට: මාර්ගය සහ බලංගොඩ වැවිලි සමාගම හිමිකම් කියන වේවැස්ස වත්ත; නැගෙනහිරට: බලංගොඩ වැවිලි සමාගම හිමිකම් කියන වේවැස්ස වත්ත, මාර්ගය සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); දකුණට: මාර්ගය සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); බටහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ මාර්ගය.

11-514

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.